# පරමාර්ථ ධර්මයන්හි අර්ථ විශ්ලේෂණය කරගැනීමෙහි ලා විශුද්ධිමාර්ග මහාසන්‍යයෙහි උපයෝගිතාව පිළිබඳ විමසීමක්

**(ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන විග්‍රහය ඇසුරෙනි)**

පිංකන්දේ දමිතසාර හිමි
කැලණිය විශ්වවිද්‍යාලය.
damithasara@gmail.com

**සාරසංක්ෂේපය**

**පාලි විසුද්ධිමග්ගය** බුද්ධඝෝෂාචාර්යයන් විසින් ව්‍යවහාර වර්ෂ පස්වන සියවසෙහි රචිත ථෙරවාදයේ මූලික ධර්ම සංග්‍රහය යි. තත් කෘතියේ දුරවබෝධ පද උත්තානීකරණය සඳහා **පරමත්ථමඤ්ජූසා** නමින් විසුද්ධිමග්ගටීකාවක් ද බදරතිත්ථවාසී ධම්මපාල තෙරුන් විසින් සම්පාදිත ය. මෙම කෘති දෙකෙහි ම අන්තර්ගත කරුණු සමුච්ත කරමින් **විශුද්ධිමාර්ග මහාසන්නය** දඹදෙණි යුගයෙහි කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු රජු විසින් රචනා කරනු ලැබේ. එවකට පාලි භාෂාවෙහි නුහුරු ජනයාට ධර්මයෙහි ගම්භීරාර්ථ ග්‍රහණය උදෙසා එය මහදු උපකාරයක් සැපයිණි. චිත්ත-චෛතසික ආදි පරමාර්ථ ධර්මයන්ගේ යථා ස්වභාවය වටහා ගැනීම උදෙසා ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශයෙන් චතුර්විධ විභාග ක්‍රමයක් **විසුද්ධිමග්ගය** ඇතුළු අට්ඨකථාවන්හි එයි. විශේෂයෙන් **විසුද්ධිමග්ගයෙහි** සීල, සමාධි, පඤ්ඤා යන මූලික පද විග්‍රහය උදෙසා මෙකී න්‍යාය ම උපයෝගී කොට තිබේ. ශීලනලක්‍ෂණය, අවිකම්පනලක්‍ෂණය, ධර්මස්වභාවප්‍රතිවේධලක්‍ෂණය පිළිවෙළින් සීල, සමාධි, ප්‍රඥාවේ ලක්ඛණ විභාගය යි. දුශ්ශීලවිධ්වංසනය, වික්ෂෙපවිධ්වංසනනය, මොහවිධ්වංසනය පිළිවෙළින් රස විභාගය යි. කාය-වාග්-මන පිරිසිදුභාවය, කම්පනවිරහිතබව, අසම්මොහය පච්චුපට්ඨාන විභාගය යි. හිරි-ඔත්තප්ප, සුඛය, සමාධිය පදට්ඨාන විභාගය යි. මෙසේ චතුෂ්ක ත්‍රිත්‍වයක් මගින් නොහොත් ස්වභාව දොළොසක් ඔස්සේ සීල, සමාධි, පඤ්ඤා විග්‍රහය සිදුකර ඇත. යථොක්ත පාරිභාෂික පදාර්ථ වටහා ගැනීමට පාලි විසුද්ධිමග්ගයට පමණක් සීමා වීම ධර්මධර ඡේකයන්ට ම උචිත ය. හුදී ජනයාට වෙනත් සුගම පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. එකී රික්තකපූරණය දෙවැනි පැරකුම් රජු විසින් මනාව සිදුකරන්නේ ලීනාර්ථපද වර්ණනාවක් ලෙසිනි. අර්ථ පරීක්‍ෂණයෙන් වටහාගත නොහැකි සංකල්පයන්ට නිදසුන් දක්වමින් පාඨකයාගේ ගැටලු විසඳීමට සමත්වීම මහඟු ශාස්ත්‍රීය දායාදයකි. ශීලනාර්ථය යනු කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණත්‍වය සහ කුශලධර්මයන්ට වන පිහිටාධාරය බව යනුවෙන් අර්ථ දක්වයි. පදට්ඨාන යනු ආසන්න කාරණය බව දක්වමින් භෞතික ද්‍රව්‍යාත්මක වස්තූන් කිහිපයක පැවැත්මට ආසන්න හේතුව උපමා කරගනිමින් මෙකී පරමාර්ථයන්හි පදට්ඨාන විශ්ලේෂණය කරයි. එසේම බෞද්ධ ඥානවිභාගයේ පරිභාවිත ස්වලක්‍ෂණය හෙවත් අනන්‍යතාව ද සාමාන්‍ය ලක්‍ෂණය හෙවත් අන්‍යොන්‍යතාව ද මෙම ධර්ම විශ්ලේෂණයෙහි ලා උපයෝගි කරගනියි. මෙසේ **පාලි විසුද්ධිමග්ගයෙහි** ධර්මාර්ථ විභාගය උදෙසා **සිංහල විසුද්ධිමග්ග මහාසන්නයෙන්** ලැබෙන පිටුබලය කෙතෙක්දැයි මෙහි ලා අධ්‍යයනය කෙරේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයයන් උපයුක්ත කොට ගනිමින් මෙම පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛ පද:** පච්චුපට්ඨාන, පදට්ඨාන, රස, ලක්ඛණ, විසුද්ධිමග්ග

# An Inquiry into the Usefulness of Vishuddhimagga-Mahasanya in Analyzing the Meaning of Paramatthā-s

Ven. Pinkande Damithasara
Department of Pali and Buddhist Studies, University of Kelaniya.
damithasara@gmail.com

## Abstract

The Pali *Visuddhimagga* is the basic canon of Theravada written by Ven. *Buddhaghosa* in the fifth century AD. Ven. *Badaratitthavāsi Dhammapāla* also composed a *Visuddhimaggatīkā* called *Paramatthamanjūsa* to exaggerate the far-fetched verses of that work. The Visuddhimagga Mahāsannaya was written by King Parakramabāhu, Honored with the name of *Kalikāla Sāhitya* Pandita in *Dambadeni* period, collecting the contents of both these works. At that time, it provided a great benefit to the people who were not familiar with the Pali language in order to grasp the essence of the Dhamma. In order to understand the real nature of objective doctrines such as Chitta-Cetasika, a fourfold examination system as *Lakkhana-Rasa-Paccupaṭṭhāna-Padaṭṭhāna* is found in the *Attakatha*-s including the *Visuddhimagga*. Especially in Visuddhimagga, this same theory has been used for the analysis of the basic terms *sīla*, *samādhi*, *paññā*. *Seelanalakkhaṇa*, *Avikampanalakkhaṇa*, *Dhammassabhāvapativedhalakkhaṇa* are the Lakkhanā-s examination of Seela, Samadhi and Paññā respectively. *Dussīlaviddhansana*, *Vikkhepaviddhansana*, *Mohaviddhansana* are the taste test respectively. Purity of body-speech-mind, non-violence, dispassion is the exam of *Paccupaṭṭhāna*. *Hiri-Otthappa, Sukha, Samadhi* are *Padaṭṭhāna* analysis. Thus the analysis of *Sīla*, *Samādhi* and *Paññā* has been done through a set of four or twelve natures. It is appropriate for Dharmadharā-s readers to limit themselves to the Pali *Visuddhimagga* to understand the actual terminology. Ordinary people need a different explanation. The complement is well done by King *Parakum* II as a exegetical work. It is a great academic gift to be able to solve the reader's problems by showing examples of concepts that cannot be understood through semantic analysis. *Śilanartha* means the uncomplicatedness of the practitioners and the adherence to the skills. Analyzing *Padaṭṭāna* in these terms, the proximate cause of the existence of several physical material objects is illustrated by stating that *Padaṭṭāna* is the proximate cause. Also, the characteristic or identity used in Buddhist epistemology and generality or reciprocity are used in the analysis of this doctrine. In this way, the support received from the Sinhala *Visuddhimagga-Mahasanna* for the Pali *Visuddhimagga* Dharma exam is studied here. This research is expected to be conducted using primary and secondary sources under the qualitative research methodology.

**Keywords**: Lakkhaṇa, Paccupaṭṭhāna, Padaṭṭāna, Rasa, Visuddhimagga